# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## බුද්ධ ධර්මය

විභාග අංකය:.........................................

| 8 ශ්‍රේණිය | I හා II පත්‍රය | කාලය පැය 02 යි |
|---|---|---|

**සැලකිය යුතුයි :**

- **අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

---

**I පත්‍රය**

01). සංඝ භේදය ඇතිකිරීම සඳහා පංචවරය ඉල්ලා සිටියේ,

1. සුභද්‍ර හිමියන්ය. 2. නන්ද හිමියන්ය
3. දේවදත්ත හිමියන්ය. 4. ඡන්න හිමියන්ය.

.

02). දිව්‍යාංගනාවක් ලබා ගැනීමේ අදහසින් භාවනා කර අවසානයේ රහත් භාවයට පත් භික්ෂූන් වහන්සේ වන්නේ,

1. ආනන්ද හිමියන්ය. 2. නන්ද හිමියන්ය.
3. චුල්ලපන්ථක හිමියන්ය. 4. මහාපන්ථක හිමියන්ය.

03). බුදුරජාණන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩ හිඳිමින් සුභද්‍ර හට දහම් දෙසීම තුළින් පෙන්නුම් කරන ගුණාංගය වන්නේ,

1. අල්පශබ්දතාවය යි. 2. නිහතමානී බව යි.
3. ආගන්තුක සත්කාරය යි. 4. මහජන මතයට ගරු කිරීම යි.

04). චතුරාර්ය සත්‍යය ගුරු උපදේශ නැතිව තමාගේ නුවණින්ම අවබෝධ කර ගත් නිසා බුදුරජාණන් වහන්සේ,

1. අරහං නම් වන සේක. 2. සම්මා සම්බුද්ධ නම් වන සේක.
3. ලෝකවිදූ නම් වන සේක. 4. සුගත නම් වන සේක.

05). භික්ෂූන් වහන්සේ විසින් භුක්තානුමෝදනාව නම් වූ ධර්ම දේශනාව පවත්වනු ලබන්නේ .

1. පිරිත් පින්කමකදී ය. 2. දානමය පින්කමකදී ය.
3. අවමංගල් උත්සවයකදී ය. 4. සරණ මංගල්‍යයකදී ය.

06). මහමග ගමන් ගත් ඡත්ත නම් තරුණයා මග රැක සිටි සොරු කණ්ඩායමක් අතින් මරණයට පත්විය. ඔහු නිදා පිබිදියාක් මෙන් මරණින් පසු දෙව්ලොව ඉපදුණේ,

1. පෙර කරන ලද කුසල කර්මයක් නිසා ය. 2. තෙරුවන් ගුණ සිහි කළ නිසා ය.
3. ඔහුට පින් අනුමෝදන් කළ නිසා ය. 4. ඔහුගේ ආයුෂ අවසන් වූ නිසා ය.

07). තෙරුවන් ගුණ ගණන

1. 24 කි .2. 26 කි.

3. 27 කි. 4. 28 කි.

.

08). උපතිස්ස පිරිවැජියාට "යේ ධම්මා හේතුප්පභවා" යන ගාථාව දේශනා කරන ලද්දේ,

1. කොණ්ඩඤ්ඤ තෙරණුවන් විසිනි. 2. අස්සජි තෙරණුවන් විසිනි.

3. සංජය පිරිවැජියා විසිනි. 4. ආනන්ද තෙරණුවන් විසිනි.

09). සැරියුත් හිමියන් රහත් වූයේ කුමන සූත්‍රය අසාද ?

1. ආදිත්‍ය පරියාය සූත්‍රය. 2. වේදනා පරිග්ගහ සූත්‍රය.

3. චක්කවත්ති සිහනාද සූත්‍රය. 4. දම්සක් පැවතුම් සූත්‍රය.

10). බෞද්ධයාගේ අත්පොත ලෙස හැඳින්වෙන ධම්මපදය අයත් වන්නේ,

1. දීඝ නිකායට ය. 2. සංයුත්ත නිකායට ය.

3. ඛුද්දක නිකායට ය. 4. අංගුත්තර නිකායට ය.

11). වැරදි අවබෝධයෙන් හටගත් ඊර්ෂ්‍යාවෙන් ගුරුවරයා දුන් වැරදි උපදෙස් ලබා ඇඟිලි දහසකින් බැඳි මාලයක් ගුරු පඬුරු වශයෙන් සපයා දීමට සිදුවීම නිසා දරුණු මිනීමරුවකු බවට පත්වූයේ ,

1.ආලවක ය. 2. අහිංසක ය.

3. උපාලි ය. 4. සංජය ය.

12). භික්ෂූන් වහන්සේලාගේ ප්‍රසාද ජනක පැවැත්ම උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ඉතා උසස් ආචාර ධර්ම පද්ධතිය හඳුන්වනු ලබන්නේ,

1. බෝධිපාක්ෂික ධර්ම නමිනි 2. අත්තූපනායික ධර්ම නමිනි.

3. සේඛියා ධර්ම නමිනි. 4. අසංඛත ධර්ම නමිනි.

.

13). ගිහියන් වන අප සැමගේ නිත්‍ය ශීලය වන්නේ,

1. පංචසීලය යි. 2. ආජීව අෂ්ටමක සීලය යි.

3. අටසීලය යි. 4. දස සීලය යි.

14). පන්සිල්වල ඇතත් අට සිල්වල ඇතුළත් නොවන ශික්ෂා පදය වන්නේ,

1. මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදය යි.
2. කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන සිකෂාපදය යි.
3. සුරාමේරය මජ්ජපමාදට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදය යි.
4. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි යන ශික්ෂා පදය යි.

15). පංචානන්තර්ය කාර්ම අතරින් එකක් නොවන්නේ,

1. මව මැරීම.
2. පියා මැරීම
3. සතුන් මැරීම
4. රහතන්වහන්සේ මැරීම

16). බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය වඩාත් ප්‍රකට වන ජාතක කථාව වන්නේ,

1. සේරිවාණිජ ජාතකය යි.
2. උම්මග්ග ජාතකය යි.
3. නලපාන ජාතකය යි.
4. තිලමුට්ඨි ජාතකය යි.

17). සත්වයන්ගේ මරණය සතර ආකාර බව බුදු දහමේ ඉගැන්වේ. ඉන් ආයුෂත් කර්මශක්තියත් යන දෙකම අවසන් වීමෙන් සිදුවන මරණය හඳුන්වන්නේ,

1. උභයක්ඛය මරණය යනුවෙනි
2. ආයුක්ඛය මරණය යනුවෙනි
3. කර්මක්ඛය මරණය යනුවෙනි
4. උපච්ඡේදක මරණය යනුවෙනි

18). ජෛන ආගමික නායකයා වූ නිගණ්ඨනාථපුත්තනම් ශාස්තෘවරයාගේ ප්‍රධාන දායකයා වූයේ ,

1. සිගාල ගෘහපතියා ය.
2. උපාලිගෘහපතියා ය.
3. සංජය පිරිවැජියා ය.
4. සකුළුදායි පිරිවැජියා ය.

19). තමා උපමාවට ගෙන අන් අයට හිංසා පීඩා නොකළ යුතු බව සඳහන් වන සූත්‍රය වන්නේ,

1. සිඟාලෝවාද සූත්‍රයේ ය.
2. වසල සූත්‍රයේ ය.
3. වේළුද්වාර සූත්‍රයේ ය.
4. පරාභව සූත්‍රයේ ය.

20).අරමුණු හඳුනා ගැනීම බුදු දහමෙහි හැඳින්වෙන්නේ,

1. රූප නම් වේ.
2. වේදනා නම් වේ.
3. සඤ්ඤා නම් වේ.
4. සංඛාර නම් වේ.

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්නය 04කට පිළිතුරු සපයන්න.**

01) ඔබ පන්තියේ බුද්ධ ධර්මය විෂයට අදාලව දෙවන වාරයේ සිදු කළ භූමිකා රංගනය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

I. මෙම ක්‍රියාකාරකම සඳහා යොදාගත් පෙළපොතේ සඳහන් පාඩමේ නම ලියන්න.
II. භූමිකා රංගනය සඳහා ඔබට ලබා දුන් ගුරු උපදේශ 02ක් ලියන්න.
III. මෙම ක්‍රියාකාරකමේදී ඔබට ඇති වූ ගැටළු දෙකක් ලියන්න.
IV. එම ගැටළු ජයගත් ආකාරය ලියන්න.
V. මෙම ක්‍රියාකාරකම මඟින් ඔබ ලැබූ සමාජ කුසලතා දෙකක් ලියන්න.
VI. පන්සීය පනස් ජාතක පොත් වහන්සේ රචනා කළේ කුමන යුගයේදී ද ?
VII. මහෞෂධ කුමරුගේ දෙමාපියන් නම් කරන්න
VIII. මියුලු නුවර පාලනය කළ රජතුමා නම් කරන්න.
IX. මහෞෂධ කුමාරා විසඳූ ප්‍රශ්න වලින් දෙකක් ලියන්න.
X. මහෞෂධ කුමාරයාගේ චරිතයෙන් ඔබගේ ජීවිතයට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

(ලකුණු 2X10 = 20)

02)

I. බුදුරජාණන් වහන්සේගේ චරිතයෙන් පිළිබිඹු වන ආචාරශීලී ගුණාංග දෙකක් නම් කරන්න.
II. ඉන් එකක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න.
III. බුදුරජාණන් වහන්සේ තුළ පැවැති ආචාරශීලී ගුණාංග ඔබේ ජීවිතය සාර්ථක කර ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5= 10)

03)

I. අගසව් දෙනම ගිහි කළ හැඳින්වූ නම් දෙක ලියන්න.
II. මුගලන් මහරහතන් වහන්සේගෙන් ශාසනයට සිදුවූ සේවාවන් තුනක් නම් කරන්න.
III. අගසව් දෙනමගේ චරිත වලින් අපේ ජීවිතයට ලබාගත හැකි ආදර්ශ පෙන්වා දෙන්න.

(ලකුණු 2+3+5= 10)

04)

I. කාව්‍යශේඛරය නම් ග්‍රන්ථයේ කතුවරයා නම් කරන්න.
II. බුද්ධ දේශනාවේ සඳහන්වන ආකාරයට ඇඳුම් ඇඳීමේ පරමාර්ථ තුන නම් කරන්න.
III. ආහාර ගැනීමේදී අප අනුගමනය කළ යුතු සේඛියා ශික්ෂා පද පහක් නම් කරන්න.

(ලකුණු 2+3+5= 10)

05)

I. බුදුරජාණන් වහන්සේ සිඟාලට පෙන්වා දුන් පරිදි හිත මිතුරන් අයත් වන දිශාව කුමක්ද?
II. සිඟාලෝවාද සූත්‍රයට අනුව සැමියා විසින් බිරිඳට ඉටුකළ යුතු යුතුකම් අතරින් තුනක් ලියන්න.
III. හොඳ මිතුරෙකු වීම සඳහා ඔබතුමා ගොඩනගා ගත යුතු ගුණ ධර්ම මොනවාදැයි පැහැදිලි කරන්න .

(ලකුණු 2+3+5= 10)

06)

I. චතුරාර්යය සත්‍යය අතරින් දෙකක් නම් කරන්න.

II. අටවැදෑරුම් දුක් අතරින් 03ක් දක්වන්න.

III. තණ්හාවෙන් වෙන්ව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන ගෙනහැර දක්වන්න.

(ලකුණු 2+3+5= 10)

07). පහත සඳහන් මාතෘකා වලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

I. ධම්ම රත්නය.
II. බුද්ධානුස්සති භාවනාව.
III. අවමංගල චාරිත්‍ර.
IV. කාම තණ්හා

(ලකුණු .5X2 = 10)